*සියලුම හිමිකම් ඇවිරිණි*
*All Rights Reserved*

## වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## දෙවන වාර පරීක්ෂණය 2018

6 ශ්‍රේණිය

# නර්තනය

කාලය පැය 02 යි.

| නම/ විභාග අංකයඃ |
|---|

## I - කොටස

- සියළුම ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුරු සපයන්න.
- අංක 01 - 05 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

01 පා සරඹ අවසානයේ නටනු ලබන්නේ,

(1) කස්තිරම (2) හමාරපදය
(3) ඉරට්ටිය (4) ගොඩ සරඹ

02 දෙවන ගොඩ සරඹයේ සරඹ නාමය වනුයේ,

(1) අඩිය (2) සිව් අඩිය
(3) දැඩිය (4) දෙපැති අඩිය

03 හනුමා වන්නමේ බෙරපදය වන්නේ,

(1) කුදගත ගත දොම් (2) කුද කුජිගත
(3) දොං ජිජිගත (4) කුදංත ගත දොම්

04 සම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩයකි.

(1) දඬුබෙරය (2) ගැටබෙරය
(3) ටින්බෙරය (4) ගොප් කොළ නලාව

05 ද්‍රවිඩ ජනයා ලී දෙකක් අතින් ගෙන රඟ දක්වනු ලබන ද්‍රවිඩ ගැමි නැටුමකි.

(1) සෙම්බු (2) කාවඩි
(3) සුලකු (4) කෝලාට්ටම්

- **ප්‍රශ්න අංක 06 - 10 දක්වා ඇති ප්‍රශ්නවලට වරහන් තුළ දී ඇති පිළිතුරු වලින් හිස්තැනට සුදුසු නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

06 "පාන්දරින් ඉස්කෝලේ" ගීතය ................................................................. මහතා විසින් පද රචනය කරන ලදී. (සෝමතිලක දිසානායක, සුනිල් ආරියරත්න)

07 ........................................................ ඇඳුම් කට්ටලය උඩරට නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන ඇඳුම් කට්ටලය වේ. (තෙල්මේ, වෙස්)

08 ......................................................................... වන්නමෙන් වඳුරකුගේ ලක්ෂණ ගැන කියවේ. (තුරඟා, හනුමා)

09 ද්‍රවිඩ කාන්තාවන් කල රැගෙන ඉදිරිපත් කරනු ලබන ගැමි නැටුමකි ................................................. නැටුම (සෙම්බු, කෝලාට්ටම්)

10 පහතරට නර්තන සම්ප්‍රදාය ප්‍රචලිත ප්‍රදේශයකි, ............................................. ප්‍රදේශය. (කුරුණෑගල, ගාල්ල)

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට හරි නම් (✓) ලකුණ ද , වැරදි නම් (×) ලකුණ ද  වරහන් තුළ යොදන්න.**

11 වෙසක් දිනවලදී ආගම් භේදයකින් තොරව අසල්වාසී හූ නෑදෑ හිතමිතුරෝ ඒකරාශි වීමෙන් වෙසක් සිරි නරඹති. (   )

12 "තත් ජිත් තොං නං තා" මෙය පළමු වන ගොඩ සරඹයේ කස්තිරම වේ. (   )

13 "දවුල" විකල්ප වාද්‍ය උපකරණයකි. (   )

14 "මගෙ පොඩි යාළු" ගීතය පද රචනා කළේ මහාචාර්ය සුනිල් ආරියරත්න මහතා ය. (   )

15 චරිත නිරූපණයේදී 'සතුට' ප්‍රකාශ කිරීමේදී ප්‍රසන්න බව මෙන්ම විනෝදය දැනවීමෙන් සතුට ප්‍රදර්ශනය වේ. (   )

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට  A  තීරුවේ ගැලපෙන පිළිතුර B  තීරුවෙන් තෝරා යා කරන්න.**

| | **A** තීරුව | **B** තීරුව |
|---|---|---|
| 16 | කෝලාට්ටම් | පහතරට නර්තන සම්ප්‍රදාය |
| 17 | හනුමා | කළගෙඩි කවි |
| 18 | ටින් බෙරය | වන්නමකි. |
| 19 | පේළි සැදී ඇඟනෝ..... | ලී කෙළි නැටුම |
| 20 | තෙල්මේ ඇඳුම් කට්ටලය | විකල්ප පාද්‍ය උපකරණයකි. |

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වන අතර, පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න 03 කට පමණක් පිළිතුරු සපයන්න.**

01 (i) සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ යන්නෙහි අදහස ලියන්න.

(ii) සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ 02 ක් නම් කරන්න.

(iii) විකල්ප වාද්‍ය උපකරණ 02 ක් නම් කරන්න.

(iv) සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ වාදනය කරන අවස්ථා 02 ක් ලියන්න.

(v) සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩයක රූප සටහනක් අඳින්න. (ලකුණු 2 x 5 = 10)

02 (i) බෞද්ධ ජනතාවට වෙසක් පොහොය දිනය වැදගත් වීමට හේතුව සඳහන් කරන්න. (ලකුණු 04)

(ii) වෙසක් උත්සවය හා සබැඳි සැරසිලි ලියන්න. (ලකුණු 03)

(iii) වෙසක් උත්සවය හා සම්බන්ධ සාරධර්ම තුනක් ලියන්න. (ලකුණු 03)

03 අසා ඇති ප්‍රශ්නවලට අනුව පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

(i) දේශීය නර්තන සම්ප්‍රදායන් තුන වගුගත කරන්න.

(ii) එම සම්ප්‍රදායන් ප්‍රචලිත ප්‍රදේශ 02 බැගින් වගුව තුළ ලියන්න.

(iii) එම සාම්ප්‍රදායන් වල ප්‍රධාන වාද්‍ය භාණ්ඩ වගුගත කරන්න.

| නර්තන සම්ප්‍රදාය | ප්‍රචලිත ප්‍රදේශ | ප්‍රධාන වාද්‍ය භාණ්ඩ |
|---|---|---|
| | | |
| | | |
| | | |

(ලකුණු 03) (ලකුණු 04) (ලකුණු 03)

04 (i) ද්‍රවිඩ ගැමි නැටුම් දෙකක් නම් කරන්න. (ලකුණු 04)

(ii) ඔබ නම් කළ ද්‍රවිඩ ගැමි නැටුම් දෙකට සමාන සිංහල ගැමි නැටුම් දෙක නම් කරන්න. (ලකුණු 03)

(iii) ද්‍රවිඩ ගැමි නැටුම් නැරඹිය හැකි අවස්ථා තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

05 (i) හනුමා වන්නමේ කවියක් ලියන්න. (ලකුණු 05)

(ii) හනුමා වන්නමේ කස්තිරම ලියන්න. (ලකුණු 05)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01 | 2 | 06 | සෝමතිලක දිසානායක | 11 | ✓ | 16 | ලී කෙළි නැටුම |
| 02 | 3 | 07 | වෙස් | 12 | ✓ | 17 | වන්නමකි. |
| 03 | 1 | 08 | හනුමා | 13 | X | 18 | විකල්ප වාද්‍ය උපකරණයකි. |
| 04 | 2 | 09 | සෙම්බු | 14 | ✓ | 19 | කළගෙඩි කවි |
| 05 | 4 | 10 | ගාල්ල | 15 | ✓ | 20 | පහතරට නර්තන සම්ප්‍රදාය |

## II කොටස

01 (i) උඩරට, පහතරට, සබරගමු නර්තන සම්ප්‍රදායන්ට ආවේණික වූ වාද්‍ය භාණ්ඩ සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ ලෙස හැඳින්විය හැකිය.

(ii) ගැටබෙරය, දවුල, තම්මැට්ටම, පහතරට බෙරය, උඩැක්කිය, අත් රබාන, තාලම්පට

(iii) එක්ස්රේ රබාන, ටින් බෙරය, දඬුබෙරය, ටොනික් පියන් වල්වලල්ල, ගස්ලබු බටනලාව, ගොප් කොළ නලාව, ලී කැබලි

(iv) පෙරහැර (ආගමික හා සාමාජීය උත්සව)
විවිධ උත්සව, මංගල අවස්ථා, අවමංගල, රාජ්‍ය උත්සව

(v) රූප සටහනක් ඇඳ ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ගැටබෙරය, දවුල, පහතරට බෙරය) (2 x 5 = 10)

02 (i) බුදුරජාණන් වහන්සේගේ ජීවිතයේ වැදගත් සිදුවීම් තුන වන ඉපදීම, බුදුවීම සහ පරිනිවන් පෑම යන තෙමඟුල සිහිපත් කිරීම සඳහා බෞද්ධ ජනතාවට වෙසක් පොහොය දිනය වැදගත් වේ.. (ල. 04)

(ii)
- අලංකාර පහන් කූඩු සෑම නිවසකම දැල්වීම.
- බෞද්ධ කොඩිවලින් සැරසීම.
- විදුලි පහන් හා විදුලි බුබුළු වලින් ආලෝකමත් කිරීම.
- දර්ශනීය තොරණ නිර්මාණය කිරීම. (ල. 03)

(iii) දන්සැල් සංවිධානය කිරීම, දරුවන් විසින් මල් දන්සැල් දීම, ඇස් කණ්ණාඩි ලබා දීම, ලේ දන් දීම, වෙසක් සුභ පැතුම්පත් හුවමාරු කර ගැනීම. (ල. 03)

03

| (i) - (ලකුණු 03) නර්තන සම්ප්‍රදාය | (ii) - (ලකුණු 04) ප්‍රචලිත ප්‍රදේශ | (iii) - (ලකුණු 03) ප්‍රධාන වාද්‍ය භාණ්ඩ |
|---|---|---|
| උඩරටු | කුරුණෑගල<br>මහනුවර<br>කෑගල්ල | ගැටබෙරය |
| පහතරට | ගාල්ල, තංගල්ල<br>මාතර, බෙන්තර<br>හොරණ | පහතරට බෙරය<br>(දෙවොල් බෙරය,<br>යක් බෙරය) |
| සබරගමු | රත්නපුර, කුරුවිට<br>කලවාන<br>බලංගොඩ | දවුල |

04 (i) සෙම්බු    කෝලාට්ටම් (ල. 03)

(ii) සෙම්බු - කළගෙඩි    කෝලාට්ටම් - ලී කෙළි (ල. 04)

(iii)
- තෛපොංගල් උත්සවය
- පෙරහැර
- සමාජ උත්සව (ල. 03)

05 (i) වන්නමට අදාළ කවියක් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල. 05)

(ii) රුංතක ජිංතක තරිකිට කුංදත්
තාග් ගජිංතක තරිකට කුංදත්
රුංතක ජිංතක තරිකිට කුංදත් තා. (නැතහොත් දීර්ඝ කස්තිරම) (ල. 05)